කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක - 35

මගේ අංකය - ඩීඑම්එස්/වැටුප්/පොදු
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
2007.07.24

සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

**කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 30 අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම - උපරිමයේ රැඳී සිටීම**

වැටුප් පරිමාණයක උපරිමයේ සිටින රාජ්‍ය සේවකයින්ට වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු ආකාරය දක්වා ඇති 2007.01.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (III) අනුව යමින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප් ක්‍රම ක්‍රියාත්මක වන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් වල වැටුප් පරිමාණයන්හි උපරිමයේ රැඳී සිටින නිළධාරීන්ගේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයට ක්‍රියාකල යුතු බව දැනුම් දෙමි.

02. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ අනුමත කර ඇති නව වැටුප් පරිමාණයන්හි උපරිමයට පැමිණෙන නිලධාරීන්ට 2006.01.01 දින සිට ඔවුන් සේවයෙන් විශ්‍රාම යන තෙක් හෝ වෙනත් වැටුප් පරිමාණයක් අදාළ වන නව තනතුරකට පත්වන / උසස්වන තුරු තවදුරටත් අවසන් වරට ලබමින් සිටි වැටුප් වර්ධක අගය මත වැටුප් වර්ධක ගෙවිය හැකිය.

03. යම් වැටුප් පරිමාණයක ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීම් ලබාගැනීමේ ඉඩකඩ ලබා ඇතිවිට එම පරිමාණයේ ඉහළම ශ්‍රේණියට උසස්වීම් ලැබ උපරිමයට පැමිණෙන නිලධාරීන්ට පමණක් මෙම ප්‍රතිලාභ අදාල වේ. වැටුප් පරිමාණය තුල පහල ශ්‍රේණිවල උසස්වීම් නොලැබීම හේතුවෙන් සිටින නිළධාරීන්ට මෙම හිමිකම අදාල නොවේ. බඳවා ගැනීමේ හා උසස්වීමේ ශ්‍රේණි ක්‍රමයක් සහිත එක් එක් වැටුප් පරිමාණයකට අදාළ උපරිම පියවර වශයෙන් සැලකිය යුත්තේ එම වැටුප් පරිමාණයෙහි ඇතුලත් ඉහලම ශ්‍රේණියට අදාළ උපරිම වැටුප් පියවර වේ. උදාහරණ වශයෙන් PL.1 වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවර වනුයේ රු. 16,820/- වැටුප් පියවරයි.

04. 2006.01.01 සිට 2006.12.31 දක්වා ගෙවීම් කිරීම 2006.01.01 දිනට ලබන වැටුපේ 50% සීමාවට යටත් වනු ඇත.

05. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ අනුව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

06. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාරය අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ලබා නොදෙන අතර, පවත්නා මූල්‍ය ප්‍රතිපාදන තුල කළමනාකරණය කරගත යුතුය.

පි.බී. ජයසුන්දර
**භාණ්ඩාගාරයේ ලේකම් සහ**
**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.**

පිටපත් -

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

} දැන ගැනීම සඳහා.